# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 54 — 1973 අප්‍රේල් 06 වැනි සිකුරාද — 1973.04.06

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (II අ) වැනි ඡේදය — පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 431 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 442 |


# තනතුරු — ඇබෑර්තු

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ජෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අනාගාකරයෙන් සඳහන් කොට නැති අවස්ථාවක් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහය රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

**3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5 ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන මුදලක් අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත් වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන් හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණය කට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියළුම නීතිරීති හා ව්‍යවස්ථාවලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශේෂ නිවේදනයයි

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු ලැබේ.

එල්. ඩබ්ලිව්. ඩී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

---

අංකය : 1/30/144 (ජී)

## ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ සේවය සඳහා සාමාන්‍ය ලිපිකරු සේවයේ, ලඝුලේඛක සේවයේ සහ යතුරු ලේඛක සේවයේ නිලධාරීන්

සාමාන්‍ය ගාස්තු ප්‍රමාණයන් මත ගැපීම් දීමනාවක් සහ ගමන් වියදම් දීමනාවක් ගෙවනු ලබන භාෂා පරිවර්තකයින් වශයෙන් චාරිකා රාජකාරි සඳහා සුදුසු නිලධාරීන් තෝරා ගැනීමෙන් ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ පවත්නා සාමාන්‍ය ලිපිකරු සේවයේ, යතුරු ලේඛක සේවයේ සහ ලඝුලේඛක සේවයේ පුරප්පාඩු පිරවීම සඳහා, (අ) සිංහල හා ඉංග්‍රීසි හෝ (ආ) සිංහල දෙමළ හා ඉංග්‍රීසි හෝ ප්‍රවීනත්වය ඇති සාමාන්‍ය ලිපිකරු සේවයේ (II වැනි පන්තියේ 'අ' බන්ධය සහ 'ආ' බන්ධය) නිලධාරීන් ගෙන් ද, යතුරු ලේඛක සේවයේ සහ ලඝුලේඛක සේවයේ නිලධාරීන් ගෙන් ද ඉල්ලුම් පත් මෙයින් කැඳවනු ලැබේ.

2. අපේක්ෂකයන් විසින් ඉහත (අ) හෝ (ආ) යටතේ සඳහන් භාෂාවන්, විෂයයන් වශයෙන් ඇතිව, යටත් පිරිසෙයින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ පොදු අධ්‍යන සහතික පත්‍රය (සාමාන්‍ය පෙළ) හෝ ලබා තිබිය යුතුය. මෙම නිවේදනයේ කාර්යයන් සඳහා භාණ්ඩාගාරය විසින් පවත්වනු ලැබූ ප්‍රවීනතා පරීක්ෂණයෙහි සිංහල/දෙමළ උසස් පෙළ සාමාර්ථයක් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ පොදු අධ්‍යයන සහතික පත්‍රය (සාමාන්‍ය පෙළ) හෝ විභාගයෙන් සාමාර්ථයකට සමාන ලෙස සලකනු ලැබේ.

3. තෝරාගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය භාෂාවෙන් මෙන්ම ඉංග්‍රීසි භාෂාවෙන් ද රාජකාරි කිරීමට කැමති විය යුතුය. සහකාර නිරවුල් කිරීමේ නිලධාරීන් කැඳවූ චාරිකා වල යෑමටත්, භාෂණ පරිවර්තන සහ භාෂා පරිවර්තන කටයුතුවල යෙදීමටත් ඔවුන් කැමති විය යුතුය.

4. මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රය ප්‍රකාර වූ ඉල්ලුම් පත්‍ර, දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන්, කොළඹ 1, යෝර්ක් වීථියේ ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ නිරවුල් කිරීමේ නිලධාරි වෙත 1973 මැයි මස 7 වැනි දින හෝ ඊට ප්‍රථම හෝ ලැබෙන පරිදි ඉදිරිපත් කළ යුතුය. අපේක්ෂකයා තෝරා ගන්නා ලද නම්, ඔහු හැකිතාක් ඉක්මණින් මුදා හරිනු ලැබිය හැකි දිනය ද, ප්‍රතියෝජනයක් අවශ්‍යවේ ද යන බවද, ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීමේදී දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් සඳහන් කළ යුතුවේ.

5. අවශ්‍ය වුවහොත්, කොළඹ දී, සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමට සුදුසු අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැකිය. එවැනි සම්මුඛ පරීක්ෂණයකදී ඔවුන්ගේ අධ්‍යාපනික සහතික පත්‍ර ඉදිරිපත් කිරීම ද අවශ්‍ය විය හැක. මෙම කාර්ය සඳහා ගමන් වියදම් හා රාජකාරි නිවාඩු ලබා ගැනීමට ඉඩ දෙනු ඇත.

6. ඉහත සඳහන් කොන්දේසි හැරුණු කොට, තෝරාගනු ලබන අයදුම් කරුවන්, ඔවුන්ට මෙතෙක් නිකුත් කර ඇති පත්වීම් ලිපි වල සඳහන් වගන්ති සහ කොන්දේසි වලින් ද බැඳී සිටිනු ඇත.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් සහ වැඩ බලන රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල්.

1973 මාර්තු 10 වැනි දින දීය.

### ආදර්ශ අයදුම් පත් ආකෘතිය

### ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ සේවය සඳහා වූ අයදුම්පත

1. සම්පූර්ණ නම, වාසගම මුලට :————.
(පැහැදිලි අකුරෙන්)

2. උපන් දිනය :————.

3. (අ) සේවය :————.

(ආ) පන්තිය, ශ්‍රේණිය හෝ බණ්ඩය සහ ඊට ඇතුළත් වූ දිනය :————.

4. සාමාන්‍ය ලිපිකරු සේවයට/යතුරුලේඛක සේවයට/ලඝුලේඛක සේවයට ඔබ බඳවා ගනු ලැබුයේ කුමන භාෂා මාධ්‍යයකින් ද ? :————.

5. දැනට සේවයේ නියුක්ත දෙපාර්තමේන්තුව සහ සේවා ස්ථානය :————.

6. කායඹාලසිය ලිපිනය :————.

7. සමත් වී ඇති උසස්ම විභාගය :————.

(අ) සිංහල

(ආ) දෙමළ

(ඇ) ඉංග්‍රීසි

(සම්මාන සාමර්ථයන් සඳහන් කරන්න)

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————

### දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

මේ අයදුම්කරු සාමාන්‍ය ලිපිකාර සේවයේ II වැනි පන්තියේ 'අ'/'ආ' බණ්ඩයේ/ලඝුලේඛක සේවයේ/යතුරුලේඛක සේවයේ නිලධාරියෙකු බව මම සහතික කරමි. 1973 ………… මස ………… දින සිට ඔහු නිදහස් කළ හැක/නොහැක. ඔහු වෙනුවට අනුප්‍රාප්තිකයෙකු අවශ්‍ය වේ/අනවශ්‍ය වේ.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

4–100—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

---

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

### තාවකාලික පේෂකම් මෝස්තර සම්පාදක (රෙදි විවීම) තනතුර

කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ තාවකාලික පේෂකම් මෝස්තර සම්පාදක (රෙදි විවීම) තනතුර සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. ඉල්ලුම් පත්‍ර පහත සඳහන් ආකෘතියට අනුව පිළියෙල කර 1973.04.30 දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. වැටුප් පරිමානය.—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් පරිමානය—රු. 6,024—144 × 4—180 × 8—රු. 8,040 වේ. රු. 6,780 සහ රු. 7,500 යන වැටුප් පරිමානයන්ට පෙර කාර්යක්ෂමතා කඩඉම් සමත් විය යුතුය.

3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :—

(i) මෙම තනතුර තාවකාලිකය.

(ii) රජයේ සේවක අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

4. අවශ්‍ය අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.—හැම ඉල්ලුම් කරුවෙකු විසින්ම තමා පහත සඳහන් සුදුසුකම් වලින් යුක්ත බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය,

(අ) (i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ, සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/ගණිතය, චිත්‍ර ශිල්පය ඇතුළු විෂයයන් 6 කින්, දෙවරකට නොවැඩි වාර ගණනකදී සමර්ථවීම

නැතහොත්

(ii) ඊට සමාන හෝ උසස් විභාගයකින් සමර්ථවීම.

(ආ) (i) පිළිගත් කාර්මික ආයතනයකින් රෙදි පිළි විවීම් සඳහා මෝස්තර සැපයීම පිළිබඳව සහතිකයක් හෝ ඩිප්ලෝමා වක් තිබීම

හෝ

(ii) මෝස්තර සහිතව රෙදි පිළි නිෂ්පාදනය සම්බන්ධයෙන් අත් යන්ත්‍ර රෙදි විවීම පිළිබඳ අඩු ගණනේ අවුරුදු 10 ක පළපුරුද්දක් තිබීම.

(ඇ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත බව.

(ඈ) 1973.04.30 වැනි දිනට වයස අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි බව. (දැනටමත් රජයේ සේවයේ නියුක්තව සිටින අයට මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**සටහන.**—අයදුම්කරුවන් විසින් කරන ලද වැඩ පිළිබඳ සැම්පල් ඉදිරිපත් කිරීම හා ඔවුන්ගේ හැකියාවන් මත පරීක්ෂණ පැවැත්වීම බලාපොරොත්තු වනු ඇත.

5. ඉල්ලුම් කරුවන් විසින් පහත සඳහන් ලියවිලි වල පිටපත් ස්වකීය ඉල්ලුම් පත්‍රවලට අමුනා එවිය යුතුය.

(අ) උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සහතිකය.

(සැ.යු.—උපකෘත පාඨශාලා රෙගුලාසි සංග්‍රහයේ කාර්ය යන් සඳහා නිකුත් කරන ලද සහතික හා බෞතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(ආ) උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) මෑතකදී ලබාගත් චරිත සහතික තුනක්.
(මෙම පිටපත් ආපසු එවනු නොලැබේ.)

(ඈ) වෘත්තීය හා/හෝ ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

**සංලක්ෂ්‍යය.**—ලියවිලි ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවක ඒවා ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයින්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

6. දැනට රජය යටතේ හෝ ප්‍රාදේශීය බල මණ්ඩල යටතේ හෝ සේවයේ යෙදී සිටින අයදුම් කරුවන් ස්වකීය අයදුම්පත් තම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම්කරුවන් ස්වකීය වියදමින් කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පැමිණිය යුතුය.

8. අයදුම් පතේ ඇති කිසියම් තොරතුරක් අසත්‍ය බැව් තෝරා ගනු ලැබීමට ප්‍රථම සොයා ගතහොත්, අයදුම් කරුවන් නුසුදුස්සන් කිරීමටද තෝරා ගනු ලැබීමෙන් පසු සොයා ගතහොත් සේවයෙන් පහකිරීමටද සිදුවනු ඇත.

9. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයෙහි සඳහන් වන්නාවූද, රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාල වන්නාවූද, පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

ජී. පී. හත්තොටුව,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (කළමනාකාරිත්ව),
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ වෙනුවට.

1973.03.22 වැනි දින,
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1.

**තාවකාලික ජේෂකම් මෝස්තර සම්පාදක (රෙදි විවීම) තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර ආකෘතිය**

(සැ.යු.—ඉල්ලුම් පත්‍ර බහාලන ලියුම් කවරයේ වම්පස මුදුන් කෙලවරේ " තාවකාලික ජේෂකම් මෝස්තර සම්පාදක (රෙදි විවීම) තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය " යන පාඨය ලියා එය ලියාපදිංචි කළ තැපැලෙන් කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ වෙත එවිය යුතුය.)

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය හා උපන් ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)

4. ජාතිය :————.

5. විවාහකද, අවිවාහකද යන බව :————.

6. අධ්‍යාපන සහ/හෝ ශිල්පීය සුදුසුකම් :————.
(සහතික වල පිටපත් ඇමිණිය යුතුයි.)

7. පාඨශාලාවෙන් අස්වූ පසු කල රැකියා සහ/හෝ හැදෑරූ අභ්‍යාස පිළිබඳ විස්තර :————.

8. මීට කලින් ආණ්ඩුවේ යම්කිසි දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක සේවය කලේ නම් එයින් අස්වීමට හේතුව සඳහන් කරන්න :————.

9. යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකදී වැරදි කරු වී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම් පිළිබඳ විස්තර සඳහන් කරන්න :————.

10. චරිත සහතික දී ඇති පුද්ගලයන් තිදෙනාගේ නම් සහ පදවි

නාම :————.

(1) :————.

(2) :————.

(3) :————.

.....................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

4-98—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

---

**ධීවර දෙපාර්තමේන්තුව**

**නාවික ඉංජිනේරු සහකාර තනතුරු**

කොළඹ, ධීවර දෙපාර්තමේන්තුවේ නාවික ඉංජිනේරු සහකාර තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් පහත දක්වෙන ආකෘති පත්‍රය පරිදි සකස් කර 1973.04.30 වැනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන්ට සැලැස්විය යුතුය.

2. **වැටුප් පරිමාණය.**—මේ තනතුරට හිමි වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේය. රුපියල් 5,016 (පුහුණුව ලබන අවුරුදු 2 තුළදී) පුහුණුව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසුව වර්ෂයකට රු. 5,880—144 හා 180—8,040.

3. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—මේ තනතුර ස්ථිරය. එහෙත් විශ්‍රාම වැටුප් අහිමිය. රජයේ අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම ලබන අවස්ථාවේදී නිලධාරියා විශ්‍රාම වැටුප් ලැබීමේ හිමිකම් ඇතිව සිටියේ නම් ඔහුට තවදුරටත් එම හිමිකම් භුක්ති විඳිය හැකිය. මෙම තනතුරට පත්කරනු ලබන්නේ අවුරුදු 3 ක පරීක්ෂණ කාලයකට යටත්වය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින්ම පහත දැක්වෙන සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(i) (අ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත බව.

(ආ) 1973.05.01 වැනි දිනට වයස අවුරුදු 25 ට නොඅඩු බවට හා 40 ට නොවැඩි බවට. (දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයට මෙම ඉහල වයස් සීමාව අදාල නොවේ.)

(ii) පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය :—

(අ) ලංකා කාර්මික විද්‍යාලයේ යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පය පිළිබඳ දිවා ඩිප්ලෝමා උපාධිය හෝ

(ආ) (i) ලංකා කාර්මික විද්‍යාලයේ කනිෂ්ඨ කාර්මික නිලධාරී සහතිකය හෝ ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ කාර්මික අභ්‍යාස ආයතනයේ යාන්ත්‍රික ශිල්පය පිළිබඳව ඩිප්ලෝමා උපාධිය හෝ ඊට සමාන සුදුසුකම්, සහ

(ii) එවැනි සහතිකයක් හෝ ඩිප්ලෝමා උපාධිය හෝ ලැබීමෙන් පසු පිළිගත් ඉංජිනේරු වැඩපොලක වැඩ පිළිබඳව අවුරුදු 5 ක ප්‍රායෝගික පළපුරුද්දක් ලබා තිබීම, හෝ

(ඇ) යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පය පිළිබඳ සැන්ද ඉංජිනේරු සහතිකය (එම්.ඊ. III) සහ පිළිගත් ඉංජිනේරු වැඩ පිළිබඳ අවුරුදු 10 ක ප්‍රායෝගික පළපුරුද්දක් ලබා සිටීම හෝ ලන්ඩන්හි " සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ඉන්ස්ටිටියුට්හි " කාර්මික විද්‍යා පිළිබඳ සහතික සහ පිළිගත් ඉංජිනේරු වැඩ පොලක වැඩ පිළිබඳ අවුරුදු 10 ක පළපුරුද්ද වැනි විකල්ප සුදුසුකම් ලබා සිටීම හෝ,

(ඈ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන හෝ උසස් හෝ සහතික පත්‍රයක් සහ පිළිගත් වැඩ පොලක 8 අවුරුද්දකට නොඅඩු කාලයක් පරිපාලන තත්ත්වය ගත කරන ලද ආධුනික කාලය ඇතුළු අවුරුදු 15 ක පළපුරුද්දක් ලබා තිබීම.

5. අයදුම්කරුවන් විසින් පහත සඳහන් ලියවිලිවල පිටපත් ස්වකීය ඉල්ලුම් පත්‍රවලට අමුණා එවිය යුතුය.

(i) උප්පැන්න ලියාපදිංචි කිරීමේ සහතිකය.

(ii) අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් පිළිබඳ සහතික.

(iii) මෑතකදී ලබාගත් චරිත සහතික තුනක් (මෙම පිටපත් ආපසු එවනු නොලැබේ.)

6. අයදුම්පත හෝ ඒවාට සම්බන්ධ ඕනෑම ලියවිල්ලක් එවිය යුත්තේ ධීවර අධ්‍යක්ෂ යන පදවි නාමයට විනා දෙපාර්තමේන්තුවේ අන් කිසිම නිලධාරියෙකුගේ පුද්ගලික නමට නොවේ.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් වන්නාවූද රාජ්‍ය සේවා තනතුරුවලට කරන

පත්වීම් සම්බන්ධයෙන් අදාල වන්නාවූ පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

ඒ. අයි. මොහිදීන්,
ධීවර අධ්‍යක්ෂ.

1973.03.13 වැනි දින,
කොළඹ, ධීවර දෙපාර්තමේන්තුවේ දී ය.

**නාවික ඉංජිනේරු සහකාර තනතුර සඳහා ඉල්ලුම්පත් ආකෘතිය**

(සැ. යු.—ඉල්ලුම්පත්‍ර බහාලන ලියුම් කවරයේ වම්පස මුදුන් කෙලවරේ "නාවික ඉංජිනේරු සහකාර තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය" යන පාඨය ලියා එය ලියාපදිංචි තැපැලෙන් කොළඹ 3, තැ. පෙ. 531, ධීවර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත එවිය යුතුය.)

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය හා උපන් ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)
1973— වැනි දිනට වයස :—අවුරුදු :——. මාස :——. දින :—.

4. ජාතිය :————.

5. විවාහකද, අවිවාහකද යන වග :————.

6. (අ) අධ්‍යාපන සුදුසුකම් :————.
(ආ) වෘත්තීය සුදුසුකම් :————.

7. පැසැලෙන් අස්වූවාට පසු කළ රක්ෂා සහ/හෝ දැරූ අභ්‍යාස පිළිබඳ විස්තර :————.

8. දැනට කරන රක්ෂාව සහ වැටුප :————.

9. චරිත සහතික දී ඇති අයගේ නම් සහ ලිපිනයන් :————.

10. වෙනත් සුදුසුකම් :————.

මවිසින් මෙම අයදුම්පතෙහි සපයා ඇති විස්තර සත්‍ය බවද, නිවැරදි බවද මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ වැරදිබව හෝ තෝරා ගැනීමට පෙර දැනගැනීමට ලැබුනහොත් ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුසු වීමටද, මේ තනතුරට මා පත් කර ගැනීමෙන් පසුව එම වරද දැනගන්නට ලැබුනහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටද බැඳී ඇති බව මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

4–136—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

---

**ලංකා ගුවන් විදුලි සංස්ථාව**

ලංකා ගුවන් විදුලි සංස්ථාවේ "විදුලි ඉංජිනේරු සහකාර" තනතුරක් සඳහා ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **සුදුසුකම්.**—(1) ගණිතය සහ භෞතික විද්‍යාව හෝ යාන්ත්‍රික විද්‍යාව හෝ රසායනික විද්‍යාව හෝ විෂයයන් සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයක්.

(2) කටුබැද්ද කාර්මික විද්‍යාලයේ විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ කණිෂ්ඨ කාර්මික නිලධාරි සහතිකය හෝ ඊට සමාන තත්ත්වයේ සුදුසුකමක්.

(3) පරිපාලන තත්ත්වයේ අවුරුදු 5 ක පළපුරුද්ද.

(4) සේවකයන් හසුරුවීමේ හැකියාව.

(5) විදුලි ඉංජිනේරු අභ්‍යාස පිළිබඳ මනා දැනීමක්.

(6) විදුලි ඉංජිනේරු ආයතනයේ නීතිවලට අනුකූලව ගොඩනැගිලි වල විදුලි කම්බි සවි කිරීම පිළිබඳව මනා පළපුරුද්දක්.

2. **වයස.**—අවුරුදු 25 සිට 40 අතර විය යුතුයි.

3. **වැටුප් ක්‍රමය.**—රු. 680—860 (30×6) කි.

මෙම දැන්වීම අග ඇති ආකෘතිය අනුව සැපයිය යුතු අයදුම්පත් 1973 අප්‍රේල් මස 26 වැනි දිනට පෙර කොළඹ 7, ලංකා ගුවන් විදුලි සංස්ථාවේ, අධ්‍යක්ෂ ජනරාල් වෙත ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුයි. ලිපි කවරයේ ඉහල වම් කෙලවර "විදුලි ඉංජිනේරු සහකාර" යනුවෙන් සඳහන් කළ යුතුයි.

ඔස්වල්ඩ් තිලකරත්න,
අධ්‍යක්ෂ ජනරාල්.

1973 මාර්තු මස 28 වැනි දින,
කොළඹ 7.

නිදර්ශන අයදුම්පත

**ලංකා ගුවන් විදුලි සංස්ථාව**

.............................................තනතුර සඳහා අයදුම්පතයි.

1. සම්පූර්ණ නම :————.
(අ) මුල් අකුරු සහිත නම :————.
(මහත්මයාද, මහත්මියද, මෙනෙවියද යන වග සඳහන් කරන්න.)

2. පුද්ගලික ලිපිනය :————.

3. උපන් දිනය :————.
1973. 04. 06 වැනි දිනට වයස : අවු. —, මාස :—, දින :—.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)

4. ජාතිය :————.

5. අධ්‍යාපන හා පුහුණුවීම් :————.

| අධ්‍යාපනය ලැබූ පාසැල් හා අසතන | දින .........සිට ......දක්වා | සමත්වී ඇති විභාගය | දරූ වගකියයුතු තත්ත්ව හා යෙදුනු පරිබාහිර කටයුතු |
|---|---|---|---|
| | | | |

6. සමත්වී ඇති උසස්ම විභාගය :—
සිංහල :————.
දෙමළ :————,
ඉංග්‍රීසි :————.

7. කාර්මික/වෘත්තීය සුදුසුකම් :————.

8. පළපුරුද්ද :————.
(ඔබගේ අතීත පළපුරුදුකම් හා රැකියා පිළිබඳ වාර්තා කාල ක්‍රමානුගතව යොදන්න.)

9. ඔබගේ පෞද්ගලික ජීවිතය ගැන හොඳින් දන්නා නෑයන් නොවන තිදෙනෙකුගේ නම්, ලිපින හා තත්ත්ව :————
1.
2.
3.

10. චරිත සහතික ලබාගෙන ඇති අයගේ නම් හා තනතුරු :—
1.
2.
3.

11. වෙනත් විස්තර :————.

මා ඉහත ප්‍රකාශ කොට ඇති කරුණු නිවැරදි හා සත්‍ය තොරතුරු බවත්, මා ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සේවයට පත් වුවහොත් මා විසින් ඉහත දෙන්නට යෙදුනු අසත්‍ය හෝ වැරදි තොරතුරක් වේනොත්, එම හේතුවෙන් සේවයෙන් පහකිරීමේ දඬුවම් ලැබීමට මා සුදුස්සෙකු වන බවත්, විශේෂයෙන්ම මීට පෙර රැකියාවල් පිළිබඳ හෝ මීට අදාල වැදගත් කිසියම් කරුණක් පිළිබඳව හෝ හිතා මතා වසන් කිරීම නිසා එවැනි දඬුවමක් මට එල්ලවන බවත් මා වටහා ගත් බව මෙයින් ප්‍රකාශ කර සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

4–135—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

### ලංකා ගමනා ගමන මණ්ඩලය

#### පුරප්පාඩු

මණ්ඩලීය සංවිධානයේ වෛද්‍ය කොට්ඨාශයේ "ෆාර්මසිස්ට්" තනතුරක් සඳහා ඉල්ලුම්පත් එවන ලෙස ශ්‍රී ලංකාවේ පුරවැසියනට මෙයින් ආරාධනය කරනු ලැබේ.

**2. පඩි ක්‍රමය.**—(මසකට සියලු දීමනාවන් ඇතුළුව) රු. 325—10 × 7—15 × 7—රු. 500.

**3. සුදුසුකම්.**—වයස 1973.03.19 වැනි දිනට අවුරුදු 25 නොඅඩුවූද අවුරුදු 35 ට නොවැඩිවූද අය විය යුතුයි.

(ii) වෘත්තීය සුදුසුකම්.—ලංකා වෛද්‍ය විද්‍යාලයේ "ෆාර්මසිස්ට්" විභාගය සමත් විය යුතුයි.

(iii) පළපුරුද්ද අවුරුදු 5 ක් විය යුතුයි.

4. **සේවා කොන්දේසි.**—තේරුන අපේක්ෂකයා ආරම්භයේ දී තුන් අවුරුදු පරිවාස කාලයක් පිට පත් කරනු ලැබේ. ඔහු පහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලිය යුතුය :—

(i) පත්වීම පිරිනැමීමට කලින් ශාරීරික යෝග්‍යතාව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකින් සමත් වීම.

(ii) දැනටමත් පණවා ඇත්තාවූද කලින් කල පණවන්නාවූද මණ්ඩලීය ව්‍යවස්ථාවන් හා රෙගුලාසි පිළිපැදීම.

(iii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම වස්, පරිවාස කාලය තුලදී මණ්ඩලය විසින් නියම කරන ප්‍රමාණයේ සිංහල ප්‍රවීණතාවයක් ලබා ගැනීම.

(iv) මණ්ඩලීය අර්ථසාධක අරමුදල සඳහා පඩියෙන් සියයට 6 ක් දායක මුදල් ගෙවීම. ඔවුන් වෙනුවෙන් ගෙවන මණ්ඩලීය දායක මුදල සියයට 9 කි.

(v) දිවයිනේ ඕනෑම ප්‍රදේශයකද, මණ්ඩලීය සංවිධානයේ කිනම් කොට්ඨාශයක වුවද සේවය කිරීමට බැඳී සිටීම.

සෑම අපේක්ෂකයෙකුම පහත සඳහන් කරුණු ගැන සම්පූර්ණ තොරතුරු සැපයිය යුතුයි :—

(අ) වයස, අධ්‍යයනික හා වෛධික සුදුසුකම්, ප්‍රායෝගික අභ්‍යාසය හා පළපුරුද්ද.

(ආ) පාඨශාලාවෙන් අස්වූදා සිට කළ රක්ෂාවල් පිළිබඳ විස්තර, ලැබුණ අන්තිම පඩිය හා දැරූ තනතුරු.

(ඇ) යම් අවස්ථාවකදී උසාවියක් මගින් ක්‍රිමිනල් අපරාධයක් සම්බන්ධයෙන් වරදකරුවෙකු යයි තීරණය කර තිබේද, යන වග. එසේ කර තිබේ නම් ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර සැපයිය යුතුයි.

5. තවද, සෑම අපේක්ෂකයෙකු විසින්ම තමා සඳහන් කළ විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, සහතික කරමින් තම ඉල්ලුම් පත්‍රයෙහි ප්‍රකාශයක් ද කළ යුතුයි. එහි සඳහන් වූ යම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව තෝරා ගැනීමට කලින් දැනගත හොත් එයින් තමා නුසුදුස්සකු විය හැකි නියාව හා තෝරා ගැනීමට පසුව සොයා ගතහොත් එයින් තමා වන්දියක් නොමැතිව සේවාවෙන් පහකර දමනු ලැබිය හැකි නියාවද සඳහන් කළ යුතුයි.

6. ඉල්ලුම්කරු විසින් තමන් ගැන තොරතුරු ලබාගත හැකි දෙදෙනෙකුන්ගේ නම් සහ ලිපිනයන්ද ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කළ යුතුයි. උප්පැන්න සහතික පත්‍රය, අධ්‍යයන සහතික පත්‍රය, යෝග්‍යතා සහතික පත්‍රය යන මේවායේ පිටපත් ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතුයි.

7. සියලු ඉල්ලුම් පත්‍ර කොළඹ 5, නාරාහේන්පිට කිරුළ පාරේ 200 වෙනි ස්ථානයේ පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවක මණ්ඩල කළමනාකාර තැන වෙත 1973 අප්‍රියෙල් මස 23 වෙනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුයි.

ලංකා ගමනාගමන මණ්ඩලයේ,
සේවක මණ්ඩල කළමනාකාරතැන.

200, කිරුළ පාර,
කොළඹ 5,
1973. 03. 19 වෙනි දින.

4–74—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

---

### කොළඹ වරාය කොමිෂන් සභාව

#### සිග්නල්කරු තනතුර

කොළඹ වරාය කොමිෂන් සභාවේ සිග්නල්කරු තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. පහත සඳහන් ආකෘති පත්‍රයට අනුකූල වන සේ පිළියෙල කරන ලද අයදුම්පත් 1973.04.28 වෙනි දිනට හෝ ඊට පෙර කොළඹ වරාය කොමිෂන් සභාවේ, වරාය කොමසාරිස් (නාවික ශාඛාව) වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

**2. වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට අදාල වාර්ෂික ඒකාබද්ධ වැටුප් පරිමාණය රු. 3,000—90 × 17—4,530 ක් වේ. රු. 3,810 වාර්ෂික වැටුපට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉමක් ඇත.)

**3. සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. තෝරා ගන්නා ලද අයදුම්කරු රජයේ අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම පළමු කොට තුන් අවුරුදු ආධුනික කාලයකට හෝ වැඩ බැලීමේ කාලයකට යටත් වේ.

**සටහන.**—1972.1.1 දිනට පෙර රජයේ සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දැරූ අයදුම්කරුවෙකු මේ තනතුරට පත්කිරීම සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහුගේ පත්වීම තවදුරටත් විශ්‍රාම වැටුප් සහිත පදනම මත වේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) කණිෂ්ඨ විභාගයන් සමත්ව ඇති බවට,

(ආ) විශිෂ්ඨ චරිතයක් හා යහපත් කායික සෞඛ්‍යයෙන් යුතු බවට,

(ඇ) 1973. 04. 28 වෙනි දිනට වයස අවුරුදු 20 ට නොඅඩු, එහෙත් අවුරුදු 35 ට නොවැඩි බවට,

(ඈ) (i) "සෙමෆෝර්" ක්‍රමයට මිනිත්තුවකට වචන 8 ද්ක්වාත්,

(ii) විදුලි ලාම්පුවේ ආධාරයෙන් "මෝස් කෝඩ්" ක්‍රමයට මිනිත්තුවකට වචන 6 දක්වාත්,

(iii) "ඉන්ටර්නැෂනල් කෝඩ්" ක්‍රමයටත්,

සංඥා පණිවුඩ යැවීමටත්, ඒවා ලබා ගැනීමටත් හැකියාවක් ඇති බවට.

5. අයදුම්කරුවන් පහත දැක්වෙන ලියකියවිලිවල පිටපත් තමන්ගේ අයදුම්පත් වලට ඇමිණිය යුතුය :—

(අ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතික පත්‍රයේ පිටපත (මුල් පිටපත නොවේ.),

(ආ) සංඥා පණිවුඩ යැවීමේ හා ලබාගැනීමේ හැකියාව පිළිබඳ සහතිකයේ පිටපත,

(ඇ) අයදුම්කරුගේ චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික තුනක් පිටපත්.

**සටහන.**—මෙම සහතික පිටපත් අයදුම්කරුවන්ට ආපසු එවනු නොලැබේ.

6. අයදුම්පත් එවිය යුත්තේ කොළඹ වරාය කොමිෂන් සභාවේ, වරාය කොමසාරිස් (නාවික ශාඛාව) වෙතය. මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට අයදුම්පත් නොඑවිය යුතුය.

මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ පළවී ඇති පත්කිරීම් පිළිබඳ පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

ඕ. ලූසිකන්ස්,
වරාය කොමසාරිස්.

1973. 03. 27,
කොළඹ 1, වරාය කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

#### කොළඹ වරාය කොමිෂන් සභාව

සිග්නල්කරු තනතුර සඳහා අයදුම්පත

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.
2. ස්ථිර ලිපිනය :————.
3. උපන් දිනය සහ  දිනට වයස :————.
4. ජාතිය :————.
5. උපන් ස්ථානය :————.
6. විවාහක හෝ අවිවාහක බව :————.
7. අධ්‍යාපනික සුදුසුකම් (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.) :————.
8. අධ්‍යාපයන ලැබූ ආයතනය හා එයින් අස්වූ දිනය :————.
9. පාඨශාලාවෙන් අස්වූවාට පසුව කරන ලද රක්ෂාවල් වල උපලේඛනය සහ ඒවා පිළිබඳ සම්පූර්ණ විස්තර :————.
10. දැනට කරන රක්ෂාව හා ලබන වැටුප :————.

11. (i) "සෙමෆෝර්" ක්‍රමයට මිනිත්තුවකට වචන 8 දක්වාත්,

(ii) විදුලි ලාම්පුවේ ආධාරයෙන් "මෝස් කෝඩ්" ක්‍රමයට මිනිත්තුවකට වචන 6 දක්වාත්,

(iii) "ඉන්ටර්නැෂනල් කෝඩ්" ක්‍රමයටත්,

සංඥා පණිවුඩ යැවීමට සහ ලබා ගැනීමට හැකියාවක් ඔබට තිබේද :————.

එසේ නම් සංඥා පණිවුඩ යැවීම හා ලබාගැනීම පිළිබඳ පළපුරුද්ද ලත් ආයතනයේ නම සඳහන් කරන්න : ————.

12. වෙනත් විශේෂ සුදුසුකම් ඇත්නම් ඒවා පිළිබඳ විස්තර : ————.

13. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම (එම සහතිකවල පිටපත් අයදුම්පතට ඇමිණිය යුතුයි.) ————.

මා විසින් මෙම අයදුම් පතෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මේ අයදුම් පතෙහි කිසියම් අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයක් තිබෙන බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් මා එයින්ම නුසුදුසු වන බවත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව දැනගන්නට ලැබුනහොත් කිසිම වන්දියක් නොගෙවා මා රාජකාරියෙන් පහකර දැමීමට යටත් වන බවත්, මම දැන සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

4–101/1—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

---

එන් එස් 5/4/57.

**කොළඹ වරාය කොමිෂන් සභාව**

**II වන පංතියේ කිත්තන්කරු (ලී) තනතුරු**

කොළඹ වරාය කොමිෂන් සභාවේ II වන පංතියේ කිත්තන්කරු (ලී) තනතුරු සඳහා අයදුම්පත් මින් කැඳවනු ලැබේ. පහතින් දැක්වෙන ආදර්ශ ආකෘතිය අනුකරණයෙන් සකස් කැරුණු අයදුම් පත් කොළඹ 1, තැ. පෙ. 528 හිමි වරාය කොමසාරිස් වෙත 1973.04.30 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලේඛන ගත තැපෑලෙන් එවිය යුතුය.

2 වැටුප් ක්‍රමය.—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 2,640—15 × 60—3,540 ක් වේ.

3. සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.—මෙම තනතුර ස්ථිර වන අතර, අර්ථසාධක අරමුදල් පදනමක් මත වනු ඇත. ඒකාබද්ධ වැටුපෙන් සියයට 6ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු අතර ඒ සඳහා රජයේ දායක මුදල සියයට 9 ක් වනු ඇත. තෝරා ගනු ලබන තැනැත්තා 1971.12.31 දින රජයේ සේවයේ විශ්‍රාම වැටුප් සහිත ස්ථිර තනතුරක් දරන්නෙකු වූයේ නම් මේ තනතුරෙහි ද විශ්‍රාම වැටුප් හිමිකම් භුක්ති විඳීමට ඔහුට හැකි වනු ඇත. පත්වීම මුල් වශයෙන් අවුරුදු 3ක පරිවාස කාලයකට යටත්ව හෝ එසේ නැතහොත් වැඩ බලන පදනම මත කෙරෙනු ඇත.

4. අවශ්‍ය සුදුසුකම් :—

(අ) 1973.04.30 දිනට අවුරුදු 21 ට වැඩි එහෙත් අවුරුදු 35 ට අඩු විය යුතුය.

(ආ) ලිවීමට හා කියවීමට හැකියාවක් තිබිය යුතුය.

(ඇ) පිළිගත් ආයතනයක II පංතියේ කිත්තන්කරුවෙකු ලෙස (සහතික මගින් තහවුරු කෙරෙන) අවුරුදු 5 ක පළපුරුද්දක් තිබිය යුතුය.

(ඈ) III වැනි පංතියේ කිත්තන්කරුවෙකු වශයෙන් යටත් පිරිසෙයින් අවුරුදු 4 ක පළපුරුද්දක් ලබා සිටිය යුතුයි.

(ඉ) කිත්තන් ගැසීමේ සියළුම අංශ ගැන මනා පළපුරුද්දක් තිබිය යුතුය.

5. අපේක්ෂකයින්—

(අ) උප්පැන්න සහතිකයේ පිටපතක් (මුල් පිටපත නොවේ),

(සැ. යු. :—බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාසැල් සඳහා රෙගුලාසි මත නිකුත් කෙරෙණ උප්පැන්න සහතික භාර ගනු නොලැබේ).

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතිකයේ පිටපත්,

(ඇ) ලබා ඇති පළපුරුද්ද දැක්වෙන සහතිකවල පිටපත් හා,

(ඈ) අපේක්ෂකයාගේ සුදුසුකම්, චරිතය හා තනතුර සඳහා ඔහු සුදුස්සකු වන්නේද යන වග දැක්වෙන පරිදි මෑතදී ලබාගත් සහතික 3 ක පිටපත් සිය ඉල්ලුම්පතට අමුනා එවිය යුත්තේ ය.

සිහිකටයුතු : මෙම සහතික පිටපත් ආපසු එවනු නොලැබේ.

6. පහතින් දක්වෙන කරුණු මත තොරතුරු සැපයිය යුතුව ඇත :—

(අ) අපේක්ෂකයා,

(ආ) අපේක්ෂකයාගේ පියා,

(ඇ) අපේක්ෂකයාගේ පිය පක්ෂයේ ආතා,

(ඈ) අපේක්ෂකයාගේ පිය පක්ෂයේ මුත්තා, උපන් ස්ථාන.

7. ඉල්ලුම්පත් මෙම දෙපාර්තමේන්තුවේ කිසි නිලධාරියෙකු වෙත පෞද්ගලිකව නොව, කොළඹ වරාය කොමිෂන් සභාවේ වරාය කොමසාරිස් (නාවික අංශය) වෙත යොමු කළ යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ඡේදයෙහි ආරම්භයේ පළකොට ඇති රජයේ සේවයේ තනතුරුවලට පත්කිරීම් වලට අදාළවූ සාමාන්‍ය සේවා කොන්දේසි කෙරෙහි අපේක්ෂකයාගේ අවධානය මින් යොමු කෙරේ.

වරාය කොමසාරිස් වෙනුවට.

තැ. පෙ. 528,
කොළඹ.
වරාය කොමිෂන් සභා කාර්යාලයේ දී ය.
1973. 03. 27 වැනි දින දීර.

**අයදුම්පත් ආකෘතිය**

**කොළඹ වරාය කොමිෂන් සභාව**

**II වන පංතියේ කිත්තන්කරු (ලී) තනතුරු**

1. සම්පූර්ණ නම.————.
(පැහැදිලි අකුරෙන්)

2. ස්ථිර ලිපිනය :————,

3. උපන් දිනය :———— වයස : අවුරුදු— මාස— දින—
(පිටපත ඇමිණිය යුතුය)

4. ජාතිය :————.

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————,

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පිය පක්ෂයේ ආතා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පක්ෂයේ මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් අයෙකු නම් (අ) කොටසට අමතරව (ආ) කොටස හෝ (ඇ) සහ (ඈ) කොටස් දෙකම සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු ලංකාවේ උපන් අයෙකු නොවේ නම් (ආ) සහ (ඇ) කොටස් හෝ (ඇ) සහ (ඈ) කොටස් (අ) කොටසට අමතරව සම්පූර්ණ කළ යුතුය).

6. විවාහක, අවිවාහක බව :————.

7. වර්තමාන රැකියාව හා එහි වැටුප :————.

8. අධ්‍යාපන සුදුසුකම් (පිටපත් ඇමිණිය යුතුය) :————.

9. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :————.

10. වෙනත් විශේෂ සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

මා විසින් මෙම අයදුම්පතෙහි දක්වා ඇති සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බවත්, මින් සහතික කරමි. මෙහි සඳහන් කර ඇති කිසියම් තොරතුරක් අසත්‍ය හෝ සාවද්‍ය බැව් මෙම තනතුර සඳහා තෝරා ගැනීමට කලින් සොයා ගනු ලැබුවහොත් මාගේ අපේක්ෂකත්වය අවලංගු වන බවද, පත් වීමෙන් පසු දැන ගනු ලැබුවහොත් කිසිම වන්දියක් නොගෙවා තනතුරෙන් පහකිරීමට ද මම යටත් වන බැව් දන්වමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

4–101/2—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

**බදුල්ල දිස්ත්‍රික්කයේ තැන්නකුඹුර කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ උඩුකිඳ කොට්ඨාශයේ විවාහ (උඩරට හා සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය**

තැන්නකුඹුර උප්පැන්න හා මරණ ලියා පදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතුකොට ගෙන ගම්වාසීන්ගෙන් සැළකුම් ලබන ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 21 කට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ විස්තර මෙම කායාීලයේ සහ ප්‍රාදේශිය ආදයම් නිලධාරි කායාීල, ග්‍රාමසේවක කායාීල, පළාත් පාලන ආයතන කායාීල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කායාීලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වල ඇතුළත් වේ.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කායාීලයෙන් ලබාගත හැකි ආකෘති පත්වල සකස්විය යුතු අතර, ඒවා 1973 අප්‍රේල් මස 27 යන දිනට හෝ එදිනට පෙර මා වෙත ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

මෙරිල් ජයසූරිය,
දිස්ත්‍රික් ලේකම් වෙනුවට.

1973 ක්වූ මාර්තු මස 22 වෙනි දින,
බදුල්ල දිස්ත්‍රික් ලේකම් කායාීලයේ දී ය.

4–9/1—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

---

**බදුල්ල දිස්ත්‍රික්කයේ ගම්පහ කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ උඩුකිඳ කොට්ඨාශයේ විවාහ (උඩරට හා සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය**

ගම්පහ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතුකොට ගෙන ගම්වාසීන් ගෙන් සැළකුම් ලබන ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 21 කට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත්වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කායාීලයේ සහ ප්‍රාදේශිය ආදායම් නිලධාරි කායාීල, ග්‍රාම සේවක කායාීල, පළාත් පාලන ආයතන කායාීල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ, ප්‍රසිද්ධ ස්ථාන සහ කායාීලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වල ඇතුළත් වේ.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කායාීලයෙන් ලබාගත හැකි ආකෘති පත්වල සකස්විය යුතු අතර, ඒවා 1973 අප්‍රේල් මස 27 වන දිනට හෝ එදිනට පෙර මා වෙත ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

මෙරිල් ජයසූරිය,
දිස්ත්‍රික් ලේකම් වෙනුවට.

1973 ක්වූ මාර්තු මස 22 වෙනි දින,
බදුල්ල දිස්ත්‍රික් ලේකම් කායාීලයේ දී ය.

4–9/2—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

---

**බදුල්ල දිස්ත්‍රික්කයේ බඹරපනේ කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ උඩුකිඳ කොට්ඨාශයේ විවාහ (උඩරට හා සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය**

බඹරපනේ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතුකොට ගෙන ගම්වාසීන් ගෙන් සැළකුම් ලබන ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 21 කට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත්වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කායාීලයේ සහ ප්‍රාදේශිය ආදායම් නිලධාරි කායාීල, ග්‍රාම සේවක කායාීල, පොලිස් ස්ථාන, පළාත් පාලන ආයතන කායාීල, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කායාීලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වල ඇතුළත් වේ.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කායාීලයෙන් ලබාගත හැකි ආකෘති පත්වල සකස්විය යුතු අතර, ඒවා 1973 අප්‍රේල් මස 27 වන දින හෝ එදිනට පෙර මා වෙත ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

මෙරිල් ජයසූරිය,
දිස්ත්‍රික් ලේකම් වෙනුවට.

1973 ක්වූ මාර්තු මස 22 වෙනි දින,
බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

4–9/3—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

---

**ආයුර්වේද දෙපාර්තමේන්තුව**

**කාය ව්‍යවච්ඡේද ප්‍රදර්ශක තනතුර**

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාය ව්‍යවච්ඡේද ප්‍රදර්ශක තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. පහත දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම් පත් 1973 අප්‍රේල් 30 වෙනි දිනට හෝ ඊට පෙර "ආයුර්වේද කොමසාරිස්, ආයුර්වේද දෙපාර්තමේන්තුව, කෝට්ටේ පාර, කොළඹ 8" යන මගේ රාජකාරි ලිපිනයට ලැබෙන්න සැලැස්විය යුතුය.

2. වැටුප් ක්‍රමය :—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේ ය : වර්ෂයකට රු. 5,736—144 × 6, 180×8—8,040 කි. වර්ෂයකට රු. 6,780 ට හා රු. 7,500 ට පෙර කායික්ෂමතා කඩඉම් ඇත.

3. සේවයට බඳවා ගැනීමේ කොන්දේසි :—

(i) මෙම තනතුර තාවකාලිකය. රාජ්‍ය සේවා අර්ථ සාධක අර මුදල් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පෞද්ගලික වෛද්‍ය වෘත්තියෙහි යෙදීමට අවසර දෙනු නොලැබේ.

4. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) විශිෂ්ඨ චරිතයක් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත විය යුතුය.

(ii) 1973 අප්‍රේල් 30 වන දිනට වයස අවුරුදු 23 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

(iii) පිළිගත් ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයකින් පිරිනැමුන ඩිප්ලෝමා සහතිකයක් ඇති බව (ප්‍රථම පන්තියේ හෝ දෙවෙනි පන්තියේ ගෞරව ඩිප්ලෝමා සහතිකය ලැබූ අය ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.).

5. අයදුම්කරුවන් පහත සඳහන් සහතික පිටපත් ඔවුන්ගේ අයදුම්පත් වලට ඈමිණිය යුතුය. (මුල් පිටපත් නොවේ.)

(අ) උප්පැන්න සහතිකය (සැ.යු.—බව්තිස්ම සහතිකපත්‍ර හෝ උපකෘත පාසැල් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ නිකුත් කරන ලද සහතික පත්‍ර භාරගනු නොලැබේ.)

(ආ) ලබා ඇති උසස්ම වෘත්තිය හා ශාස්ත්‍රීය සහතික පත්‍ර.

(ඇ) චරිතය පිළිබඳ ව මෑතකදී ලබාගත් සහතික පත්‍ර දෙකක් (රජයේ සේවයේ නියුක්ත වූවන්ට මෙම උප වගන්තිය යටතේ සහතික පත්‍ර උවමනා නො කෙරේ.)

සැලකිය යුතුය :—අයදුම්පත් සමග අමුණා එවන කිසිම ලියවිල්ලක් හෝ සහතික පිටපතක් ආපසු එවනු නො ලැබේ.

6. ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ රාජ්‍ය සේවා තනතුරු වලට අදාල වන පොදු කොන්දේසි මෙම තනතුර කෙරෙහි ද බලපානු ලැබේ. එකී කොන්දේසි බලන්න.

වී. බ. වැවේගම,
ආයුර්වේද කොමසාරිස්.

1973 මාර්තු 26 දින,
ආයුර්වේද දෙපාර්තමේන්තුව,
කොළඹ 8.

### ආදර්ශ ඉල්ලුම් පත

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාය ව්‍යවච්ඡේද ප්‍රදර්ශක තනතුර

1. සම්පූර්ණ නම :———.
   - (අ) පෙළපත් නාමය :———.
   - (ආ) අනික් නම් :———.
2. ලිපිනය :———.
3. උපන් දිනය හා ස්ථානය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිනිය යුතුය.) :———.
   1973. 04. 30 වෙනි දිනට වයස :—
   අවුරුදු :———. මාස :———. දින :———.
4. ලාංකිකයෙක්ද නැද්ද යන බව :———.
   ලාංකිකයෙක් වූයේ පරම්පරාවෙන්ද නැතහොත් ලියාපදිංචි වීමෙන්ද යනබව :———.
5. ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් (සහතික පිටපත් ඇමිණිය යුතුය) :———.
6. ලබා ඇති ඩිප්ලෝමාව පිළිබඳ විස්තර (සහතික පිටපත් ඇමිණිය යුතුය) :———.
   - (i) ලබා ඇති ඩිප්ලෝමාව :———.
     අංශය : (යුනානි/ආයුර්වේද/සිද්ධ)
   - (ii) එය ලැබූ වර්ෂය :———.
   - (iii) ලබා ඇති පන්තිය :———.
   - (iv) ලැබූ ආයතනය :———.
7. ලබා ඇති පශ්චාත් උපාධි පිළිබඳ විස්තර (පිටපත් ඇමිණිය යුතුය) :———.
   - (i) ලබා ඇති පශ්චාත් උපාධිය :———.
   - (ii) එයලැබූ වර්ෂය :———.
   - (iii) ලැබූ ආයතනය :———.
8. ලියාපදිංචි වෛද්‍යවරයෙක් නම් ලියාපදිංචි අංකය හා වර්ෂය : ———.
9. පෞද්ගලික වෛද්‍ය වෘත්තියෙහි පළපුරුද්ද (සහතික පිටපත් ඇමිනිය යුතුය) :———.
10. මෙතෙක් යම් රජයේ තනතුරක් දැරුවේ නම් එම තනතුරු හා පත්වූ දින, අස්වූ දින හා අස්වීමට හේතු :———.
11. වෙනත් කරුණු :———.

මා විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු සැබෑ බවද, නිවැරදි බවද මෙසින් සහතික කර සිටිමි. මෙහි දක්වා ඇති තොරතුරු යම් හෙයකින් අසත්‍ය බව තෝරා ගැනීමට පෙර දැන ගන්නට ලැබුණොත්, මා පත්වීම ලැබීමට නුසුදුස්සකු වන බවද, පත්වීමට පසු දැන ගන්නට ලැබුනහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා සේවයෙන් පහ කරනු ලබන බවද මා දන්නා බව මෙසින් දන්වමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

4–104—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

---

### ආයුර්වේද දෙපාර්තමේන්තුව

ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ විද්‍යාව පිළිබඳ කථිකාචාර්ය තනතුර

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ, ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ විද්‍යාව පිළිබඳ කථිකාචාර්ය තනතුර සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙසින් ආරාධනය කරනු ලැබේ. පහත සඳහන් ආකෘති පත්‍රයට අනුව පිළියෙල කරගත් ඉල්ලුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර කොළඹ 1, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර: 1973 අප්‍රියෙල් මස 27 වැනිදා.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර: 1973 මැයි මස 4 වැනිදා.

සටහන් :—

(i) ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයැදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(ii) පිටරටවල අයැදුම්කරුවන්, තම ඉල්ලුම්පත්‍ර සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී බාරදීමට අයැදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iii) වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත්කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. සේවයේ නියුක්ත කිරීමේ වගන්ති හා කොන්දේසි :—

මෙම තනතුර ස්ථිරය, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

3. වැටුප් ක්‍රමය :—

මෙම තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේ ය—වර්ෂයකට රුපියල් 6,720—360×12—11,040 කි. රුපියල් 9,600 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇත. මෙම කඩඉමෙන් ඔබ්බට උසස් කිරීම සඳහා විද්‍යාත්මක නිබන්ධයක් පිළියෙල කළ යුතුය. මෙම කඩඉමෙන් උසස් කරනු ලබන්නේ එම නිබන්ධය අනුමත කළහොත් පමණි.

4. අවශ්‍ය සුදුසුකම් :—

සෑම අයැදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(බී) 1973. 4. 6 වැනි දිනට අවුරුදු 25 ට නොඅඩු බව හා අවුරුදු 40 ට නොවැඩි බව (රජයේ සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව බලපාන්නේ නැත.)

(සී) රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව හා භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් විෂයයන් දෙකක් සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයක විද්‍යාව පිළිබඳ උපාධියක් ඇති බව. (මෙම විෂයයන්ගෙන් විෂයයක් පිළිබඳ ගෞරව උපාධියක් නම් වඩාත් මැනවි.)

(ඩී) යටත් පිරිසෙයින් තුන් අවුරුද්දකට නොඅඩු අධ්‍යයන පොදු සහතික (සාමාන්‍ය පෙළ) විභාගයට වඩා උසස් තත්ත්වයේ විභාගයකට ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති බව,

(ඊ) දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීමට හැකි බව.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු නො ලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය,

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික,

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

- (i) අයැදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.
- (ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයැදුම්පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

7. අයැදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් නැනට හැර මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ 1 වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

සී. ඊ. එස්. වීරතුංග,
සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්.

1973 මාර්තු මස 26 දින,
කොළඹ 1,
ගාලු මුවදොර,
මහ ලේකම් ගොඩනැගිල්ලේ,
සෞඛ්‍ය අමාත්‍යාංශයේ දී ය.

අංකය :————.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි.)

සෞඛ්‍ය අමාත්‍යාංශය

ඉල්ලුම් පත්‍ර පෝර්මය

1. ඉල්ලුම් කරන තනතුර :—

තනතුර :————.

දෙපාර්තමේන්තුව :————.

2. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

3. තැපැල් ලිපිනය :————.
(ලිපිනයෙහි වෙනසක් වුවහොත් එය වහාම දැනුම් දිය යුතුයි)

4. උපන් දිනය :—

වර්ෂය :————. මාසය :————. දිනය :————.

5. දේශීය ඉල්ලුම් පත්‍ර බාරගන්නා අවසාන දිනය වන විට නියම වයස :—

වර්ෂ :————. මාස :————. දින :————.

6. ඔබ ලංකා රටවැසියෙක් ද ? පාරම්පරික රටවැසියෙක් ද එසේ නැත හොත් ලියාපදිංචි වූ රටවැසියෙක් ද යන බව සඳහන් කරන්න. (සටහන අංක (1) බලන්න) :—

7. උපන් ස්ථානය (සටහන අංක (2) බලන්න) :—

(අ) ඉල්ලුම්කරුගේ :————.

(ආ) පියාගේ :————.

(ඇ) පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.

(ඈ) පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :————.

8. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :————.

(ආ) ඔබ විවාහක ද ? අවිවාහක ද ? වැන්දඹුවෙක් ද , වැන්දඹුවකද, යන බව :————.

9. සාමාර්ථ්‍යය ලබා ඇති ඉහළම විභාගය :—

(1) සිංහල (2) දෙමළ (3) ඉංග්‍රීසි

(1) ————.

(2) ————.

(3) ————.

10. වයස අවුරුදු 12න් පසු ඉගෙනීම ලැබූ පාඨශාලා සහ වෙනත් ආයතන :————.

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | ආයතනය | සිට | දක්වා |
| (1) | | | (1) | | |
| (2) | | | (2) | | |
| (3) | | | (3) | | |
| (4) | | | (4) | | |

11. ක්‍රීඩා පිළිබඳව ලබා ඇති විශිෂ්ඨත්ව පිළිබඳ විස්තර සහ ඒ අංශයෙහි ඔබ විසින් උසුලන ලද වගකිවයුතු පදවි පිළිබඳ විස්තර :————.

12. (ඒ) ඔබ ණය ගැති භාවයෙන් මිදී සිටින්නේ ද? ණය ගැතිව සිටින්නේ නම් ඒ කොපමණකට ද ?

(බී) ඔබ සාපරාධී වරදකට උසාවියක දී චෝදනා ලැබුවෙක් ද ? එසේ නම්, දිනයන් සහ නඩු අංකය සමඟ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න.

13. අධ්‍යාපන, වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් (ලබා ගන්නා ලද සියලුම උපාධි, විශිෂ්ය සමර්ථ වෘත්තීය හා කාර්මික සුදුසුකම්වල විස්තර, ඒවා යේ දින, පංතියක් වේ නම් එය, ඒවා සඳහා ගන්නා ලද විෂයයන් සහ ඒවා ලබාගත් ආයතන වල නම් සඳහන් කරන්න)

| | පදවිය | සිට | දක්වා | වාර්ෂික වැටුප රු. |
|---|---|---|---|---|
| 14. දනට නිරත රක්ෂාව හා ඊට ප්‍රථමයෙන් කරන ලද රක්ෂාවල්: (රක්ෂාවට බැඳුනු දිනය, ඉන් අස් වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න) සැලකිය යුතුයි.—ආණ්ඩුව යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි පහළ 16 වැනි කොටුවෙහි සඳහන් කළ යුතුය. | (1) | | | |
| | (2) | | | |
| | (3) | | | |
| | (4) | | | |
| | (5) | | | |
| | (6) | | | |
| | (7) | | | |
| | (8) | | | |

15. **විශේෂ සුදුසුකම්.**—(දැන්වීමෙහි දක්වෙන විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට ඇත්තේ ද? එසේ ඇතහොත් දිනයන් ද ඇතුළුව ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න. විශේෂ සුදුසුකම් කිසිවක් නියම කොට ඇද්දැයි ගැසට් නිවේදනය බලන්න)

16. තවත් තොරතුරු කිසිවක් වේ නම් ඒවා :—

17. මෙම ඉල්ලුම් පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත්කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————.

ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

**සටහන්.**—(1) ඔබ ලංකාවේ රට වැසියකු වී සිටින්නේ ලියාපදිංචි වීමෙන් නම්, ඔබට නිකුත් කරනලද රටවැසි සහතිකයේ යොමු අංකය සහ දිනය සඳහන් කරන්න.

(2) ඉල්ලුම්කරු උපන්නේ ලංකාවේ නම් (අ) වලට අතිරේක වශයෙන් (ආ) හෝ (ඇ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු/ඇ උපන්නේ ලංකාවේ නොවේ නම් (අ) වලට අතිරේකව (ආ) සහ (ඇ) හෝ (ඈ) හෝ පිරවිය යුතුයි.

අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම්, ඔහු පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :—

————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ පදවිනාමය.

දිනය :————.

4-87—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

## පාර්ලිමේන්තු සහ ක්‍රීඩා අමාත්‍යාංශය

### සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂ (කාර්මික) තනතුර

පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂ (කාර්මික) තනතුර සඳහා ඉල්ලුම් පත් එවන ලෙස ආරාධනය කරනු ලැබේ. පහතින් දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කල ඉල්ලුම් පත්‍ර පහත සඳහන් දිනයනට හෝ ඊට පෙර කොළඹ, ටොරිංටන් පෙදෙසේ අංක 33 දරණ ස්ථානයේ පිහිටි පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

මෙරට ඉල්ලුම් පත්‍ර : 1973 අප්‍රේල් මස 27 දින.

පිටරට ඉල්ලුම් පත්‍ර : 1973 මැයි මස 4 දින.

සටහන්.—

(i) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදු විය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

(ii) පිටරටවල අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර කොළඹ 7, ටොරිංටන් පෙදෙසේ අංක 33 දරණ ස්ථානයේ පිහිටි පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළතදී බාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iii) වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු :—ශ්‍රී ලංකා ජනරජය යටතේ සේවය කරනු සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ශ්‍රී ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින් ම ගෙවිය යුතු වෙයි.

2. සේවයේ නියුක්ත කිරීමේ වගන්ති හා කොන්දේසි :—

(i) මෙම තනතුර ස්ථිරය. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) තෝරා ගනු ලබන අයදුම්කරු 1969. 02. 07 දින අංක 14,840 දරණ රජයේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද සෞඛ්‍ය සේවයේ වෛද්‍ය පිරිස් පිළිබඳ සටහන් පෙළෙහි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධාරීන් ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීම සම්බන්ධව ඇති අවශ්‍යතාවය දක්වන රෙගුලාසීන්ගෙන් පාලනය වේ.

3. වැටුප් හා දීමනා :—වර්ෂයට රු. 9,600 න් පටන්ගෙන රු. 360 වාර්ෂික වර්ධක 4 කින් ද, රු. 480 වාර්ෂික වර්ධක 10 කින් ද, රු. 600 වාර්ෂික වර්ධක 5 න් ද, රු. 18,840 දක්වා වැඩිවන ඒකාබද්ධ වැටුපක් මෙම තනතුරට හිමි වේ.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධාරීන්ට ගෙවනු ලබන කොන්දේසින්ට යටත් ව විශ්‍රාම වැටුප් අහිමි දීමනාවක් ද ගෙවනු ලැබේ.

සටහන.—ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ රු. 14,880 වැටුප් පියවර ලබා ගැන්මට අයදුම්කරුවෙක් හිමි වනුයේ සුදුසු ක්‍රීඩා වෛද්‍ය මධ්‍යස්ථානයක ලැබූ චිකිත්සාගාර පුහුණුවක් ද සහිත්ව කායික වෛද්‍ය ක්‍රමය පිළිබඳ වූ ඩිප්ලෝමාවක් හෝ ඒ සමාන වූ වෙනත් ඩිප්ලෝමාවක් ලබාගතහොත් පමණකි.

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුකරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.

(අ) විශිෂ්ට චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(ආ) මෙරට ඉල්ලුම් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට වයස අවුරුදු 30 කට නොඅඩු සහ අවු. 45 කට නොවැඩි විය යුතු ය.

සටහන.—දැනටද රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.

(ඇ) වෛද්‍ය සීමාවාසිකය අවසන්ව අඩුම වශයෙන් අවුරුදු දෙකක පළපුරද්දක් ඇති සෞඛ්‍ය දෙපාර්තමේන්තුවක පිළිගත් වෛද්‍ය නිලධාරියෙකු විය යුතු ය.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතු ය.

(අ) උප්පැන්න සහතිකය, (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු නොලැබේ.)

(ආ) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය ;

(ඇ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඈ) වෘත්තිය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතිකය.

සැ. යු :—

(i) අයැදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයින්ගේ අයැදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් නැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියකුගේ නාමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටස (IIඅ) වන ඡේදය ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

එල්. ඩබ්ලිව්. මඩුගල්ලේ,
ලේකම්,
පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය.

1973 මාර්තු මස 27 දින,
කොළඹ 7, ටොරිංටන් පෙදෙසේ අංක 33 හි,
පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ දී ය.

අංකය : [ ]

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි.)

### පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය

### ඉල්ලුම්පත්‍ර පෝරමය

1. ඉල්ලුම්කරන තනතුර :

........................................................................ තනතුර

........................................................................ දෙපාර්තමේන්තුව

2. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

3. තැපැල් ලිපිනය :————.

(ලිපිනයෙහි වෙනසක් වුවහොත් එය වහාම දැනුම් දිය යුතුය)

4. උපන් දිනය :—

වර්ෂය :————. මාසය :————. දිනය :————.

5. දේශීය ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය වන විට නියම වයස :—

වර්ෂ :————. මාස :————. දින :————.

6. ඔබ ශ්‍රී ලංකා රටවැසියෙක් ද ? පාරම්පරික රටවැසියෙක් ද ? එසේ නැතහොත් ලියාපදිංචි වූ රටවැසියෙක් ද ? යන බව සඳහන් කරන්න. (සටහන අංක 1 බලන්න) :————.

7. උපන් ස්ථානය :—

(අ) ඉල්ලුම්කරුගේ :————.

(ආ) පියාගේ :————.

(ඇ) පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.

(ඈ) පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :————.

8. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :————

(ආ) ඔබ විවාහක ද ? අවිවාහක ද ? වැන්දඹුවෙක් ද ? වැන්දඹුවක ද ? යන බව :————

9. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :—

(1) සිංහල :————.

(2) දෙමළ :————.

(3) ඉංග්‍රීසි :————.

10. වයස අවුරුදු 12 පසු ඉගෙනීම ලැබූ පාඨශාලා සහ වෙනත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | ආයතනය | සිට | දක්වා |
| (1) | | | (1) | | |
| (2) | | | (2) | | |
| (3) | | | (3) | | |
| (4) | | | (4) | | |

11. ක්‍රීඩා පිළිබඳ ලබා ඇති විශිෂ්ඨත්ව පිළිබඳ විස්තර සහ ඒ අංශයෙහි ඔබ විසින් උසුලන ලද වගකිවයුතු පදවි පිළිබඳ විස්තර : ————.

12. (එ) ඔබ නයගැති භාවයෙන් මිදී සිටින්නේ ද? ණය ගැතිව සිටින්නේ නම් ඒ කොපමණකට ද? :————.

(බී) ඔබ සාපරාධී වරදකට උසාවියක දී චෝදනා ලැබූවෙක් ද? එසේ නම් දිනයන් සහ නඩු අංකය සමග සම්පූර්ණ විස්තර සඳහන් කරන්න :————.

13. අධ්‍යාපන, වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් (ලබාගන්නා ලද සියලුම උපාධි, විශිෂ්ඨ සාමාර්ථ වෘත්තීය සහ කාර්මික සුදුසුකම් වල විස්තර, ඒවායේ දින, පන්තියක් වේ නම් එය, ඒවා සඳහා ගන්නා ලද විෂයයන් සහ ඒවා ලබාගත් ආයතනවල නම් සඳහන් කරන්න) :————.

14. දැනට නිරත රක්ෂාව හා ඊට ප්‍රථමයෙන් කරන ලද රක්ෂාවල් :—

(රක්ෂාවට බැඳුණු දිනය, ඉන් අස්වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වැටුප සඳහන් කරන්න

සැලකිය යුතුයි.—ශ්‍රී ලංකා ආණ්ඩුව යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි පහළ 15 වැනි කොටුවෙහි සඳහන් කළ යුතුය.

| පදවිය | සිට | දක්වා | වාර්ෂික වැටුප රු. ශ. |
|---|---|---|---|
| (1) | | | |
| (2) | | | |
| (3) | | | |
| (4) | | | |
| (5) | | | |
| (6) | | | |
| (7) | | | |
| (8) | | | |

15. තවත් තොරතුරු කිසිවක් වේ නම් ඒවා :————.

16. මෙම ඉල්ලුම් පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සෙකු වීමට යටත් බවත්, පත්කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

සටහන.—(1) ඔබ ශ්‍රී ලංකාවේ රටවැසියකු වී සිටින්නේ ලියාපදිංචි වීමෙන් නම්, ඔබට නිකුත් කරන ලද රටවැසි සහතිකයේ යොමු අංකය සහ දිනය සඳහන් කරන්න.

අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම්, ඔහු පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :—

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ පදවි නාමය.

දිනය :————.

4–107—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

අංකය : 1/59/19 (ජී)

**රජයේ ලසුලේඛක සේවයේ පහළ ශ්‍රේණියට බඳවා ගැනීමේ (සිංහල) විභාගය—1973 අප්‍රේල් මස 7**

ඉහත සඳහන් විභාගය සම්බන්ධයෙන් 1973 පෙබරවාරි මස 2 වැනි දින අංක 45 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ නිවේදනය කෙරෙහි සියලුම විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන්ගේ අවධානය මෙයින් යොමුකරවනු ලැබේ.

2. රජයේ ලඝුලේඛක සේවයේ පහළ ශ්‍රේණියට බඳවා ගැනීමේ (සිංහල) විභාගය 1973 අප්‍රේල් මස 7 වෙනි දින නොව 1973 මැයි මස 12 වෙනි දින පවත්වන බව සියලුම විභාගාපේක්ෂක/අපේක්ෂිකාවන් වෙත මෙයින් දන්වනු ලැබේ.

ආර්. එම්. බී. සේනානායක,
රාජ්‍ය පරිපාලන, අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

1973 මාර්තු මස 27 වනි දින,
කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේ,
ඒකාබද්ධ සේවා අංශයේ දී ය.

4–113—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

**මිනින්දෝරු දෙපාර්තමේන්තුව**

**සැලසුම්කරුවන්ට බලපත්‍ර දීම පවත්වනු ලබන විභාගය**

සැලසුම්කරුවකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට සර්වේ ජනරාල්ගේ සහතික පත්‍රය සඳහා විභාගය කොළඹ දී පවත්වනු ලැබේ. විභාගය, I වැනි කොටස කණ්ඩාංක සෙවීම සහ II වැනි කොටස සැලැස්ම ඇඳීම, වශයෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මධ්‍යයෙන් පවත්වනු ලැබේ.

2. විභාගයේ I වැනි කොටස 1973 ජූනි මස 2 වැනි දින පැවත් වෙන අතර, II වනි කොටස 1973 ජූලි මස 2 වැනි ආරම්භ වනු ඇත. I වැනි කොටසින් අසමත්වන අපේක්ෂකයින් II වැනි කොටසට පෙනී සිටීමට අවශ්‍ය නොවන්නේ ය.

3. අපේක්ෂකයින්ට (අ) කෝණමානය හා කණ්ඩාංක යන දෙකේ ආධාරය ඇතිව ක්ෂේත්‍ර සටහන්වලින් නිවැරදි ලෙස සැලැස්මක් ඇඳීමට හැකි බවත්, (ආ) එසේ නිවැරදි ලෙස අඳින ලද සැලැස්ම ගණන් බැලීමට හැකි බවටත් මා හට ඒත්තු ගැන්වීම අවශ්‍යය.

4. සහතික පත්‍රය ප්‍රදානය කරනු ලැබීමට, අපේක්ෂකයින්, I වැනි සහ II වැනි යන කොටස් දෙකෙන්ම එකවර සමර්ථ විය යුතුය.

5. විභාගය සඳහා ඉල්ලීම් රුපියල් 12 ක ගාස්තුවක් සමග, මා වෙත ලියා ඉදිරිපත් කළ යුතුය මුද්දර මගින් එවනු ලබන විභාග ගාස්තු භාර ගනු නොලැබේ. චෙක්පත්/මුදල් ඇණවුම්/තැපැල් ඇණවුම්, සර්වේ ජනරාල්ට ලැබෙන සේ එවිය යුතුය. මෙම කාර්යාලයෙන් ඉල්ලුම් පත්‍ර ෆෝර්ම සපයනු නොලැබේ. පහත සඳහන් විස්තර සැපයිය යුතුය :—

(අ) සම්පූර්ණ නම :————.

(ආ) ස්ථිර ලිපිනය :————.

(ඇ) උපන් දිනය :————.

(ඈ) සමර්ථ වී ඇති උසස්ම විභාගය සහ මාධ්‍යය :————.

(ඉ) විභාගයට පෙනී සිටීමට බලාපොරොත්තු වන භාෂා මාධ්‍යය :————.

6. අයදුම් පත්‍ර 1973 අප්‍රේල් මස 30 වැනි දිනට පසු භාරගනු නො ලැබේ.

7. අපේක්ෂකයින්ට චිත්‍ර කඩදාසි සහ කණ්ඩාංක පත්‍ර විභාගයේ දී සපයනු ලැබේ. කෙසේ වෙතත් අයදුම්කරුවන් තම තමන්ගේ ඇඳීම් උපකරන, කණ්ඩාංක ගිණීම සඳහා චක්‍ර සහ ඔවුනට අවශ්‍ය අනිකුත් උපකරණ සපයා ගත යුතුය.

8. (1) විභාගයට ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවෙකු විසින්ම විභාගය සඳහා තමන් පෙනී සිටින එක් එක් විෂයක් පාසා විභාග පරිපාලකයේ තෘප්තියට හේතුවන පරිදි ස්වකීය අනන්‍යතාවය, ඔප්පු කළ යුතුය. මේ කාරණය සඳහා පහත සඳහන් ලියවිලි අතුරෙන් එකක් ඉදිරිපත් කළ හැකි ය :—

(අ) පෝස්ට් මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරන ලද අනන්‍යතා පත්‍රයක් ;

(ආ) මෙම විභාගය පවත්වන දිනට අවුරුදු 3 කට වැඩි නොවන කාලයක් ඇතුළත නිකුත් කරන ලද වලංගු පාස්පෝට් බල පත්‍රයක් ;

(ඇ) මෙම විභාගය පවත්වන දිනට අවුරු 3 කට වැඩි නොවන කාලයක් ඇතුළත ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක අධිකාරිත්වය යටතේ නිකුත් කරන ලද අයිතිකරුගේ ඡායාරූපයක් ද සහිත බලපත්‍රයක් හෝ අන්‍ය ලියවිල්ලක් ;

(ඈ) පාස්පෝට් ප්‍රමාණයේ උඩුකය ඡායාරූපයක් අයදුම්කරුගේ අත්සන එහි පසුපිටේ යොදා එම අත්සන සහ පසු පිටේ ඡායාරූපය අයදුම්කරුගේම බව, සැළකිය යුත්තෙක් (ප්‍රවේශ පත්‍රය සහතික කිරීමට සුදුසු වර්ගයට අයත් කෙනෙක්) සහතික කළ යුතුය. සහතික කරන්නාගේ නම, පදවිය, ලිපිනය හා දිනය එහි සඳහන් කළ යුතුය. මෙවැනි ඡායාරූප පිටපත් විභාග පරිපාලක විසින් රඳවා ගන්නවා ඇත.

(II) (I) වැනි ඡේදයේ අවශ්‍යතාවය පරිදි, තමන්ගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් සාක්කියක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට, විභාගයට පෙනී සිටීම හෝ පෙනී සිටීම සඳහා අයිතිය ඉල්ලීම කළ නොහැක.

ආර්. ඒ. ගුණවර්ධන,
වැඩ බලන සර්වේ ජනරාල්.

ප්‍රගති/සිරි ශාඛාව,
සර්වේ ජනරාල් කාර්යාලය,
තැ. පෙ. 506, කොළඹ 5,
1973 මාර්තු මස 22 වැනි දින.

4–10—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

---

## සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව

### එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ශිෂ්‍යත්ව

පහත දැක්වෙන විෂයයන් යටතේ 1973 වර්ෂයේ දී ශිෂ්‍යත්ව හතරක් සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව මගින් ප්‍රදානය කරනු ලැබේ :—

2. **විෂයයන්.**—

| | |
|---|---|
| 1. සිංහල | 9. චිත්‍ර ශිල්පය |
| 2. ව්‍යවහාර දෙමළ | 10. කාව්‍ය ශාස්ත්‍රය හා සංගීතය |
| 3. හින්දි | 11. සමයාන්තර ඥාණය හෝ සමයාන්තර ආගම් දැනුම |
| 4. පාලි | 12. ජනප්‍රවාද |
| 5. සංස්කෘත | 13. මානව ශාස්ත්‍රය |
| 6. බෞද්ධ දර්ශනය | 14. දේශ විභාග |
| 7. පුරාවිද්‍යාව | 15. න්‍යාය ශාස්ත්‍රය |
| 8. ඉතිහාසය | |

3. **ආධාර මුදල.**—යථොක්ත විෂයයන් හදාරන පශ්චාත් උපාධි අපේක්ෂකයෙකුට රු. 2,400 ක මුදලක් ආධාර වශයෙන් ගෙවනු ලැබේ. මෙය ගෙවනු ලබන්නේ මසකට රු. 100 බැගින් වන පරිදි අවුරුදු දෙකක් තුළදීය.

4. **සුදුසුකම්.**—පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියකු විය යුතුය. එසේ නැතහොත් ශිෂ්‍යත්ව මණ්ඩලය පිළිගන්නා උපාධියට සමාන වෙනත් අධ්‍යාපන සුදුසුකම් තිබිය යුතුය.

5. **වෙනත් කරුණු.**—මෙම වර්ෂයේ දී පිරිනැමෙන ශිෂ්‍යත්ව හතර ඉහත සඳහන් විෂයයන් අතුරෙන් විෂයයන් හතරකට, එක් විෂයයක් සඳහා එක් ශිෂ්‍යත්වයක් බැගින් සීමා වනු ඇත. ඉහත සඳහන් විෂයයන් අතුරෙන් තමන් කැමැති විෂයයක් තෝරා ගත හැකිය. නියමිත විෂයය පිළිබඳ පර්යේෂණ කටයුතු විශ්ව විද්‍යාලයීය අභ්‍යන්තර ශිෂ්‍යයකු ලෙස හෝ බාහිර ශිෂ්‍යයකු ලෙස කළ හැකිය.

6. **අයදුම් කිරීම.**—දැනට විශ්ව විද්‍යාලයක පාඨමාලා හදාරන අපේක්ෂකයින් එකී විශ්ව විද්‍යාලය මගින් ද රැකියාවක නියුතු අපේක්ෂකයින් තම සේව්‍යයා මගින් ද සෙසු අපේක්ෂකයින් කෙලින්මද ඉල්ලුම් කළ යුතුය.

මේ සමග ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූල වන පරිදි අයදුම්පත් අපේක්ෂකයින් විසින් පිළියෙල කරගත යුතුය. අයදුම්පත් බහාලු කවරයේ වම්පස ඉහළ කෙළවරේ, "එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ශිෂ්‍යත්ව" යන්න සඳහන් කළ යුතුය.

සියලුම අයදුම්පත් 1973 අප්‍රේල් මස 25 වැනි දිනට පෙර, කොළඹ 7, ධර්මපාල මාවතේ අංක 135, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

කෙ. ආ. පි. අභයවර්ධන,
සංස්කෘතික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ.

කොළඹ 7,
ධර්මපාල මාවතේ අංක 135,
සංස්කෘතික කටයුතු පිළිබඳ
දෙපාර්තමේන්තුවේ දීය,
1973 මාර්තු 21.

---

## සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව

### එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ශිෂ්‍යත්ව අයදුම්පත

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය හා ස්ථානය :————.

(1973 අප්‍රේල් මස 25 වැනි දිනට වයස : අවු :——, මාස :——. දින :——).

4. ජාතිය :————.

5. විවාහකද, අවිවාහක ද යන බව :————.

6. ඉහළතම අධ්‍යාපනික සුදුසුකම් :—

(i) සිංහල :————.
(ii) දෙමළ :————.
(iii) ඉංග්‍රීසි :————.
(iv) වෙනත් භාෂා :————.

7. දැනට කරන රැකියාව :————.

8 උපාධිය පිළිබඳ විස්තර :—

(i) විශ්ව විද්‍යාලය :————.
(ii) ගෞරව උපාධියක් ද සාමාන්‍ය උපාධියක් ද යන බව :————.
(iii) මාධ්‍යය :————.
(iv) පංතිය :————.
(v) විෂයයන් :————.
(vi) වර්ෂය :————.

9. පශ්චාත් උපාධිය සඳහා නියමිත විෂයයන් (ගැසට් නිවේදනයේ 2 වැනි ඡේදය බලන්න) අතුරෙන් හතරක්, කැමැත්තේ අනුපිළිවෙලට.

(i) :————.
(ii) :————.
(iii) :————.
(iv) :————.

10. පශ්චාත් උපාධිය සඳහා නිබන්ධය ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවන මාධ්‍යය :————.

11. වෙනත් සුදුසුකම් :————.

ම විසින් මෙම අයදුම් පතෙහි සපයා ඇති විස්තර සත්‍ය බවද, නිවැරදි බවද, මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ තෝරාගැනීමට පෙර දැන ගැනීමට ලැබුණ හොත් ඒ හේතුවෙන් මා තෝරාගනු ලැබීම සඳහා නුසුදුසු වීමටද, තෝරාගනු ලැබීමෙන් පසුව එම වරද දැන ගන්නට ලැබුණහොත් මගේ ශිෂ්‍යත්වලාභිත්වය අවලංගු කරනු ලැබීමට යටත් වන බවද මට ශිෂ්‍යත්වය යටතේ ගෙවා ඇති යම් මුදලක් වේ නම් එය ආපසු ගෙවීමට මා බැඳී සිටින බවද මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

4–14—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

**(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)**

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිට ය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවක් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සෙනසුරාදා පෙරවරු 8 සිට දවල් 12 දක්වාද, වෙනත් දිනවල පෙරවරු 8 සිට පස්වරු 3.30 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුයි.

4. සෙනසුරාද පෙරවරු 11ට සහ වෙනත් දිනවල පස්වරු 2.30 ට මුදල් ගනුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළකරන්නට නියමිත "පිටපත" කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ රෙජිස්ට්‍රාර් මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 20 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාද දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ "ගැසට්" පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණාලයාධිපති තැනට ලැබෙනසේ එවිය යුතුයි.

13. 1968.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු* :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. | මෙරට ශ. | | පිටරට රු. | පිටරට ශ. |
|---|---|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 46 | 0 | ... | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 36 | 0 | ... | 42 | 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් .. ... | 43 | 50 | ... | 51 | 50 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නොඅඩු කාලයකට පමණ ය.

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ රු. | මිළ ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. | තැපැල් ගාස්තු මෙරට ශ. |
|---|---|---|---|---|---|
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී එක කොටසක් ... | 0 | 50 | ... | 0 | 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... | 1 | 0 | ... | 0 | 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡේදයක් | 0 | 30 | ... | 0 | 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, I වැනි කොටසේ ඡේදයක් ... | 0 | 60 | ... | 0 | 15 |

දායක මුදල් භාර ගැනීම සහ තනි පිටපත් විකිණීම භාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් විනාවාක් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|---|---|
| මාර්තු | ... | 73. 3. 2 සිකුරාද | ... | 73. 2.21 බදාද | දවල් 12.00 |
| | | 73. 3. 9 සිකුරාද | ... | 73. 2.28 බදාද | දවල් 12.00 |
| | | 73. 3.16 සිකුරාද | ... | 73. 3. 7 බදාද | දවල් 12.00 |
| | | 73. 3.23 සිකුරාද | ... | 73. 3.14 බදාද | දවල් 12.00 |
| | | 73. 3.30 සිකුරාද | ... | 73. 3.21 බදාද | දවල් 12.00 |
| අප්‍රේල් | ... | 73. 4. 6 සිකුරාද | ... | 73. 3.28 බදාද | දවල් 12.00 |
| | | 73. 4.11 බදාද | ... | 73. 4. 4 බදාද | දවල් 12.00 |
| | | 73. 4.19 බ්‍රහස්පතින්ද | ... | 73. 4.11 බදාද | දවල් 12.00 |
| | | 73 4.27 සිකුරාද | ... | 73. 4.18 බදාද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.